# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2213/35 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2021.02.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 10/2017 (III).

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2. ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ දී සිදු කරනු ලබන මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනු, මේ නියෝගවල සහ මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් සීමාවන්, නියම සහ කොන්දේසිවලට යටත්ව, පනතේ 4 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට යම් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් සිදු කරනු ලැබීමට අවසර දෙනු ලැබූ විදේශ විනිමයෙන් වූ බලයලත් ප්‍රාග්ධන ගනුදෙනු වර්ග විය යුතු ය.

3. මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින්ම පනතේ 9 වන වගන්තිය යටතේ, කලින් කලට, මහ බැංකුව විසින්, ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධානවලට අනුකූල විය යුතු ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. (1) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ නිරත වන සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින්ම -

(අ) ගනුදෙනුව සිදු කරනු ලබන තැනැත්තාගේ සද්භාවය; සහ

(ආ) එම ගනුදෙනුව මේ නියෝගවලට අනුකූල වන බව,

ඒ සම්බන්ධයෙන් වූ ලේඛනගත සාක්ෂි ලබා ගැනීම මගින් නිශ්චය කරගනු ලැබිය යුතු ය.

(2) මේ නියෝග යටතේ ප්‍රාග්ධන ගනුදෙනුවල නිරත වන සෑම තැනැත්තකු විසින්ම, (1) වන ඡේදයේ කාර්යය සඳහා, යම් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත අවශ්‍ය සියලු ලේඛනගත සාක්ෂි සපයනු ලැබිය යුතු ය.

(3) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින්ම පූර්ණ නිසි උද්යෝගයෙන් කටයුතු කළ යුතු ය.

5. මේ නියෝග සමඟ අනුකූල වීමට අපොහොසත් වන යම් බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන යම් තැනැත්තකු සම්බන්ධයෙන් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් අවශ්‍ය වන බවට සලකනු ලැබිය හැකි යම් ක්‍රියාමාර්ගයක් ගනු ලැබිය හැකි ය.

6. මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනුවලට සම්බන්ධ (සියලු අතරමැදියන්, ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්, ඒකක භාර, අන්‍යොන්‍ය අරමුදල් සහ මූල්‍ය ආයතන ඇතුළුව) ශ්‍රී ලංකාව තුළ නේවාසික යම් තැනැත්තකු විසින්, එම ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී මේ නියෝග සමඟ අනුකූල වී ඇති බවට සහතික වීමට වගබලා ගත යුතු ය.

7. මෙහි උපලේඛනයේ 1 වන කොටසේ "ආ" ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති සෑම විදේශීය සමාගමක් විසින්ම එම සමාගම, මෙහි උපලේඛනයේ 1 වන කොටසේ "ආ" ශීර්ෂය යටතේ නිශ්චිතව දක්වා ඇති නියමයන් සහ කොන්දේසි සමඟ අනුකූල වන බවට සහතික වීමට වග බලා ගත යුතු ය.

8.(1) මේ නියෝගවල කාර්යය සඳහා "නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්" යන්නෙන් -

(අ) එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො.);

(ආ) යුරෝ;

(ඇ) ස්ටර්ලිං පවුම්;

(ඈ) ඕස්ට්‍රේලියානු ඩොලර්;

(ඉ) සිංගප්පූරු ඩොලර්;

(ඊ) ස්වීඩන ක්‍රෝනර්;

(උ) ස්විස් ෆ්‍රෑන්ක්;

(ඌ) කැනේඩියානු ඩොලර්;

(එ) හොංකොං ඩොලර්;

(ඒ) ජපන් යෙන්;

(ඔ) ඩෙන්මාර්ක ක්‍රෝනර්;

(ඕ) නෝර්වීජියානු ක්‍රෝනර්;

(ක) චීන රෙන්මින්බි; සහ

(ග) නවසීලන්ත ඩොලර්,

අදහස් වේ.

(2) මහ බැංකුව විසින්, පනතේ 9 වන වගන්තිය යටතේ ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධාන මගින්, කලින් කලට (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ එකතු කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

9. 2019 පෙබරවාරි මස 28 වන දින අංක 2112/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග, ඒ යටතේ කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

10. මේ නියෝගවල කාර්යය සඳහා -

"පනත" යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ප්‍රාග්ධන ගනුදෙනුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ඇපයෙන් සීමිත සමාගම්" යන්නට 2007 අංක 7 දරන සමාගම් පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"කොටස් වලට පරිවර්තනය කිරීම" යන්නෙන් -

(අ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගමක් විසින් නිකුත් කරනු ලබන වරණීය කොටස් මේ නියෝග යටතේ හෝ ඉවත් කරන ලද විනිමය පාලන පනත යටතේ සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීමක්;

(ආ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගමක් විසින් ලබා ගනු ලබන හෝ නිකුත් කරනු ලබන ණය හෝ ණය සුරැකුම්පත්, මේ නියෝග යටතේ හෝ ඉවත් කරන ලද විනිමය පාලන පනත යටතේ සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීමක්; හෝ

(ඇ) නිෂ්පාදකවරයා හෝ නිෂ්පාදකවරයාගේ බලයලත් නියෝජිතයා විසින් තක්සේරු කරන ලද, ආනයනික යන්ත්‍රෝපකරණවල වටිනාකම, එම යන්ත්‍රෝපකරණවල පිරිවැය දරනු ලැබූ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමක නාමයෙන් සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීමක්;

අදහස් වේ;

"විගාමිකයා" යන්නට, කලින් කලට සංශෝධනය විය හැකි පරිදි වන 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/36 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවල දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"කොටස් සඳහා හිමිකම" යන්නෙන්, නිකුත් කරන්නා විසින් කරන ලද සංස්ථායී ක්‍රියාවන් ප්‍රකාරව හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සමාගම්වල ඒකාබද්ධවීම් හෝ සම්බන්ධවීම් ප්‍රකාරව හෝ උරුමය සහ අනුප්‍රාප්තියට අදාළ නීතිය ප්‍රකාරව (විගාමිකයකු ඇතුළුව) නේවාසික නොවන පුද්ගලයකු වෙත උරුම වීම ප්‍රකාරව හෝ සමීපතම පවුල් සාමාජිකයකු විසින් (විගාමිකයකු ඇතුළුව) නේවාසික නොවන පුද්ගලයකු වෙත ත්‍යාග වශයෙන් හෝ අධිකරණ නියෝගයක් යටතේ බේරුම් කිරීමක් වශයෙන් හෝ නිකුත් කරන ලද හෝ පවරන ලද යම් කොටස් අදහස් වේ;

"සමීපතම පවුල් සාමාජිකයන්" යන්නෙන්, දෙමව්පියන්, සීයා, ආච්චි, කලත්‍රයා සහ දරුවන් අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"බලපත්‍රලාභී මුදල් සමාගම" යන්නෙන් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මුදල් සමාගමක් අදහස් වේ;

"බලපත්‍රලාභී මූල්‍ය ආයතනය" යන්නෙන් -

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක්;

(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්;

(ඇ) 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත යටතේ බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්; හෝ

(ඈ) බලපත්‍රලාභී මූල්‍ය සමාගමක්,

අදහස් වේ;

"බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"අමාත්‍යවරයා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මුදල් මණ්ඩලය" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"විදේශ සමාගම" යන්නට, 2007 අංක 7 දරන සමාගම් පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ඉවත් කරන ලද විනිමය පාලන පනත" යන්නෙන් (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත අදහස් වේ;

"පරිසීමිත වෙළෙන්දා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"සිල්ලර වෙළඳාම" යන්නෙන්, පෞද්ගලික හෝ ගෘහස්ථ පරිභෝජනය හෝ පාවිච්චිය සඳහා අලුත් සහ භාවිත කළ භාණ්ඩ පොදු මහජනතාව වෙත නැවත විකිණීම (වෙනස්කම් සිදු කිරීමකින් තොරව විකිණීම) අදහස් වේ;

"විශේෂිත කල්බදු සමාගම" යන්නෙන් කල්බදු මූල්‍යකරණ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් අදහස් වේ;

"රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසාය" යන්නෙන්, කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පනහකට වැඩි ප්‍රමාණයක හිමිකම ශ්‍රී ලංකා රජය විසින් දරනු ලබන, ශ්‍රී ලංකා රජයේ රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයක් අදහස් වේ;

"ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර" යන්නෙන්, ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් නාමනය කරන ලද ණය සාධන පත්‍රයක් අදහස් වේ.

(2 වන සහ 7 වන නියෝග).

**උපලේඛනය**

1 වන කොටස

**ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු**

**අ. අවසරලත් ආයෝජන**

1. ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු, ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද දේශීය අරමුදල්, ප්‍රාදේශීය අරමුදල්, ආයෝජන අරමුදල් සහ අන්‍යොන්‍ය අරමුදල් (නේවාසික නොවන ආයෝජකයින්) විසින්, ශ්‍රී ලංකාවේ දී පහත දැක්වෙන වර්ගවල ප්‍රාග්ධන ගනුදෙනුවල නිරත වනු ලැබිය හැකි ය:-

(1) උපලේඛනයේ මේ කොටසේ "අ" ශීර්ෂය යටතේ 7 සහ 8 වන ඡේදවල දක්වා ඇති බැහැර කිරීම් සහ සීමා කිරීම්වලට යටත්ව, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගම් විසින් නිකුත් කරනු ලැබූ, කොටස් සඳහා වූ හිමිකමක් හෝ කොටස්වලට පරිවර්තනය කිරීමක් යටතේ වන සියලු වර්ගවල කොටස් අත්පත් කර ගැනීම, දැරීම හෝ අත්හැර දැමීම;

(2) (බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු සමාගම් සහ ඇපයෙන් සීමිත සමාගම් සහ ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද විදේශීය සමාගම් හැර) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගම් විසින් නිකුත් කරන ලද වසර 3 ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා වන (ලැයිස්තුගත ණය සුරැකුම්පත් හැර) ණය සුරැකුම්පත්වල නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ආයෝජනය කිරීම;

(3) බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් හෝ විශේෂිත කල්බදු සමාගම් විසින් අදාළ නියාමන අධිකාරීන්හි අනුමැතිය සහිතව නිකුත් කරන ලද ණය සුරැකුම්පත්වල නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ආයෝජනය කිරීම;

(4) (බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු සමාගම් සහ ඇපයෙන් සීමිත සමාගම් සහ විදේශීය සමාගම් හැර) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගම් වෙත වසර 3 ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කිරීම;

(5) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරනු ලැබූ මව් සමාගම විසින් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ විදේශීය සමාගමක් ලෙස ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරන ලද එම විදේශීය සමාගමේ ශාඛා කාර්යාලයක් වෙත හෝ ව්‍යාපෘති කාර්යාලයක් වෙත නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කිරීම;

(6) අදාළ රේඛීය අමාත්‍යාංශයෙන් සහ වෙනත් යම් අදාළ අධිකාරියකින් අනුමැතිය ලබා ගැනීමට යටත්ව ශ්‍රී ලංකා රජය වෙත හෝ රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයන් වෙත ණය ප්‍රදානය කිරීම;

(7) අදාළ නියාමන අධිකාරිවල අනුමැතියට යටත්ව, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම් වෙත විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කිරීම;

(8) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට හෝ සීමාකිරීම්වලට යටත්ව -

(අ) ඒකක භාරවල හෝ අන්‍යොන්‍ය අරමුදල්වල ඒකකයන්හි;

(ආ) රජයේ සුරැකුම්පත්වල (භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් යම් සුරැකුම්පත්);

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව හෝ යම් රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයක් හෝ වෙනත් යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් විසින් නිකුත් කරනු ලබන සුරැකුම්පත්වල;

(ඈ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල (ශ්‍රී.ල.ස.බැ.);

(ඉ) පනතේ 4 වන වගන්තියට යටත්ව, ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් බලපත්‍රලාභී මූල්‍ය ආයතනවල කාලීන තැන්පතුවල;

(ඊ) නිශ්චල දේපළවල; හෝ

(උ) ලැයිස්තුගත ණය සුරැකුම්පත්වල;

ආයෝජනය කිරීම.

(9) ණය ලබා ගන්නාගේ විදේශ විනිමය ඉපැයුම්වලින් එම ණයවල සියලු ආපසු ගෙවීම් සිදු කරන්නේ නම්, ණය ලබා ගන්නාගේ ක්‍රියාකාරී ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් ණය මුදල භාවිත කිරීමේ කාර්යය සඳහා ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමි, ශ්‍රී ලංකාව තුළ පිහිටි 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වන සමාගම් වෙත අවුරුදු තුනකට අඩු කාලයක් සඳහා වන ණය ප්‍රදානය කිරීම.

(10) අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි යම් විධානවලට අනුකූලව මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් යම් ආයෝජන වර්ගයක ආයෝජනය කිරීම.

2. නේවාසික නොවන පුද්ගලයකු විසින්, සමීපතම පවුල් සාමාජිකයකුගෙන් ත්‍යාගයක් වශයෙන් හෝ උරුමය සහ අනුප්‍රාප්තියට අදාළ නීතිය ප්‍රකාරව උරුමයක් වශයෙන්, හෝ අධිකරණ නියෝගයක් යටතේ වූ බේරුම්කිරීමක් වශයෙන් උපලේඛනයේ මේ කොටසේ "අ" ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන, (2) වන, (3) වන සහ (8) වන අනුඡේදවල දක්වා ඇති වත්කම් අත්පත්කර ගනු ලැබිය හැකි ය.

3. විගාමිකයකු විසින්, නේවාසික තැනැත්තකු හෝ විගාමිකයකු වන්නා වූ දෙමව්පියන්ගෙන්, සීයා හෝ ආච්චීගෙන්, සහෝදර සහෝදරියන්ගෙන් හෝ කලත්‍රයාගෙන් ත්‍යාගයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ යම් වත්කමක් අත්පත්කර ගනු ලැබිය හැකි ය. විගාමිකයකු විසින්, උරුමය සහ අනුප්‍රාප්තියට අදාළ නීතිය ප්‍රකාරව උරුමයක් වශයෙන් ශ්‍රී ලංකාවේ යම් වත්කමක් අත්පත්කර ගනු ලැබිය හැකි ය.

4. උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන, 2 වන සහ 3 වන ඡේදවල නිශ්චිතව දක්වා ඇති සියලු ප්‍රාග්ධන ගනුදෙනු, පහත දැක්වෙන කොන්දේසිවලට යටත් විය යුතු ය:-

(1) අවසරලත් ආයෝජනවලට අදාළව අරමුදල් ශ්‍රී ලංකාව තුළට රැගෙන ඒමට හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට යැවීමට සැලැස්වීමේ යාන්ත්‍රණය,

(අ) ඉහත සඳහන් කරන ලද අවසරලත් ආයෝජන සඳහා ගෙවනු ලැබිය යුතු ප්‍රතිෂ්ඨා මුදල්, යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් විවෘතකර පවත්වාගෙන යන්නා වූ ආමුඛ ආයෝජන ගිණුමක් හරහා ගෙවනු ලැබිය යුතු ය;

(ආ) එම ආයෝජනවලින් උපයා ගනු ලබන සියලු ආදායම් සහ යම් ප්‍රාග්ධන ලැබීම්, එම ආයෝජනය සිදු කරන ලද ආමුඛ ආයෝජන ගිණුම වෙත බැර කරනු ලැබිය යුතු ය;

(ඇ) උපලේඛනයේ මේ කොටසේ "අ" ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (මුදල් මණ්ඩලය විසින් එසේ අවසර ලබා දී ඇත්නම්) (4) වන, (5) වන, (6) වන, (7) වන, (8) (අ) වන සහ (9) වන අනුඡේද යටතේ අවසර ලබා දී ඇති ආයෝජන සඳහා සහ (8) වන අනුඡේදය යටතේ අවසර ලබා දී ඇති වෙනත් යම් ආයෝජන සඳහා, ඉහත (අ) සහ (ආ) අයිතමයන්හි නිශ්චිතව දක්වා ඇති, නේවාසික නොවන ආයෝජකයකුගේ ආමුඛ ආයෝජන ගිණුමක් හරහා අරමුදල් ගෙවීමේ අවශ්‍යතාවය අනිවාර්ය නොවේ.

(ඈ) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (8) වන අනුඡේදයේ (අ) අයිතමය යටතේ අවසර ලබා දී ඇති ආයෝජන සඳහා සෘජුවම ප්‍රේෂණ සිදු කරනු ලබන අවස්ථාවක දී සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට, බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට, ශ්‍රී ලංකා රජයට සහ රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයන් වෙත ණය ප්‍රදානය කර ඇති අවස්ථාවක දී එම ආයෝජනවලින් ලැබෙන සියලු ආදායම් සහ ප්‍රාග්ධන ලැබීම්, ආයෝජිතයා විසින් නේවාසික නොවන ආයෝජකයා වෙත සෘජුවම සියරට යවනු ලැබිය හැකි ය;

(ඉ) උපලේඛනයේ මේ කොටසේ "අ" ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (9) වන අනුඡේදයේ සඳහන් කර ඇති ණය මුදල, ණය ලබා ගන්නා විසින් විවෘත කර පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ණය මුදල් ගිණුමකට බැර කළ යුතු අතර පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව එම ව්‍යාපාරික විදේශ ව්‍යවහාර ණය මුදල් ගිණුම හරහා ම එම ණය මුදලේ සියලු ආපසු ගෙවීම් සිදු කළ යුතු ය. කිසිඳු අවස්ථානුගත කරුණු යටතේ වුව ද රුපියල් පරිවර්තනය කිරීමක් ආකාරයෙන් එම ණය මුදල් පියවීමට අවසර ලබා නොදිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ණය වශයෙන් මුදල් ලබා ගන්නා වූ, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, ශ්‍රී ලංකා රජය සහ රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයන් හැර ශ්‍රී ලංකාවේ නේවාසික යම් තැනැත්තකු විසින්, එම ණය මුදල් ලබා ගැනීම සඳහා සහ ණය සේවා කිරීම සහ ණය ආපසු ගෙවීම සඳහා පනත යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත් ව විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුමක් විවෘත කර පවත්වා ගෙන යා යුතු ය.

(3) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (6) වන සහ (7) වන අනුඡේද යටතේ සිදු කරන ලද ණය ලබා ගැනීම් පිළිබඳ වාර්තා කිරීම -

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් ණය ලබා ගැනීම් සිදු කරනු ලබන අවස්ථාවක දී, එම ණය ලබාගැනීම් පිළිබඳ විස්තර (දිනය, ණය මුදලේ ප්‍රමාණය සහ ව්‍යවහාර මුදල් වර්ගය, ණය කාල සීමාව

සහ ණය ලබා දෙන්නා පිළිබඳ විස්තරය ඇතුළුව) ඊළඟ මාසයේ පහළොස් වන දින හෝ ඊට පෙර විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය;

(ආ) ශ්‍රී ලංකා රජය සහ රාජ්‍ය හිමිකම සහිත ව්‍යවසායයන් විසින් ණය ලබා ගැනීම සිදු කරනු ලබන අවස්ථාවක දී, (දිනය, ණය මුදලේ ප්‍රමාණය සහ ව්‍යවහාර මුදල් වර්ගය, ණය කාල සීමාව සහ ණය ලබා දෙන්නා පිළිබඳ විස්තරය ඇතුළුව) එම ණයමුදල් ලබා ගැනීම් පිළිබඳ විස්තර, ණය මුදල් ලැබීමෙන් එක් මසක් ඇතුළත, (අදාළ වන පරිදි) මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය;

(4) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (4) වන සහ (5) වන අනුඡේද යටතේ ලබාගෙන ඇති ණය, ණය ලබාගන්නා විසින්, ණය කාල සීමාව අවසානයේදී සම්පූර්ණයෙන් ම ගෙවනු ලැබිය හැකි හෝ ණය ගිවිසුමේ නියමයන්ට අනුකූලව ණය කාල සීමාව තුළ ක්‍රමක්ෂය කරනු ලැබිය යුතු ය.

(5) උරුමයෙන් ලද හෝ ත්‍යාග වශයෙන් ලැබුණු හෝ අධිකරණ නියෝගයක් යටතේ ලැබුණු ආයෝජනවලින් හෝ වත්කම්වලින් ලද ලැබීම් ආපසු සියරට බලා යැවීම.

(අ) (අදාළ වන පරිදි) උරුමය සහ අනුප්‍රාප්තියට අදාළ නීතිය ප්‍රකාරව හෝ සමීපතම පවුල් සාමාජිකයකුගෙන් ත්‍යාගයක් වශයෙන් හෝ යම් අධිකරණ නියෝගයක් යටතේ බේරුම් කිරීමක් වශයෙන් නේවාසික නොවන පුද්ගලයකු වෙත ලැබුණු අවසරලත් ආයෝජනවල යම් ආදායම් සහ යම් ප්‍රාග්ධන ලැබීම්, එකී ආයෝජනය මේ නියෝගවලට අනුකූලව මුල් ආයෝජකයා විසින් සිදු කරනු ලැබ ඇත්තේ නම්, ප්‍රතිලාභියා විසින් විවෘත කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

(ආ) (අදාළ වන පරිදි) උරුමය සහ අනුප්‍රාප්තිය පිළිබඳ නීතිය ප්‍රකාරව හෝ සමීපතම පවුල් සාමාජිකයකුගෙන් ත්‍යාගයක් වශයෙන් හෝ යම් අධිකරණ නියෝගයක් යටතේ බේරුම් කිරීමක් වශයෙන් නේවාසික නොවන පුද්ගලයකු වෙත ලැබුණු අවසරලත් ආයෝජනවල යම් ආදායම් සහ යම් ප්‍රාග්ධන ලැබීම්, එකී ආයෝජනය, 2017 නොවැම්බර් මස 20 වන දිනට පෙර මුල් ආයෝජකයාගේ (ආමුඛ ආයෝජන ගිණුමක් ලෙස නැවත නම් කරන ලද) සුරැකුම්පත් ආයෝජන ගිණුමක් හෝ වෙනත් යම් ගිණුමක් හරහා සිදු කරන ලද ආමුඛ ප්‍රේෂණ මගින් සිදු කරනු ලැබ ඇත්තේ නම්, ප්‍රතිලාභියා විසින් විවෘත කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

(ඇ) (විගාමිකයකු හැර) නේවාසිකයකු නොවන පුද්ගලයකු වෙත, මියගිය නේවාසික තැනැත්තකුගෙන්, උරුමය සහ අනුප්‍රාප්තිය පිළිබඳ නීතිය ප්‍රකාරව උරුම වී ඇති හෝ නේවාසිකයකු වන සමීපතම පවුල් සාමාජිකයකුගෙන් ත්‍යාග වශයෙන් ලැබී ඇති හෝ නේවාසිකයකු විසින් දරනු ලබන වත්කම් සම්බන්ධයෙන් අධිකරණ නියෝගයක් යටතේ බේරුම් කිරීමක් වශයෙන් ලැබී ඇති යම් අවසරලත් ආයෝජනයක යම් ආදායමක් සහ යම් ප්‍රාග්ධන ලැබීම් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව, එ.ජ.ඩො. 30,000ක වාර්ෂික දීමනාවට යටත්ව, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමකට බැර කර එය හරහා ආපසු සියරට යවනු ලැබිය යුතු ය.

(ඈ) වෙනත් විගාමිකයකු හෝ විගාමිකයකු වන සමීපතම පවුල් සාමාජිකයකු විසින් යම් ආයෝජනයක් එම විගාමිකයා විසින් ශ්‍රී ලංකාවේ නේවාසිකයකුව සිටින අතරතුර දී, සිදු කරනු ලැබූ හෝ ඔහුගේ හෝ ඇයගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් හරහා මෙම නියෝග ක්‍රියාත්මක වීමට පෙර සිදු කරනු ලැබූ හෝ උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 6 වන ඡේදය යටතේ අවසර ලබා දී ඇති පරිදි සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී, වෙනත් විගාමිකයාගෙන් හෝ විගාමිකයකු වන සමීපතම පවුලේ සාමාජිකයාගෙන්, (විගාමිකයකු හැර) නේවාසික නොවන තනි පුද්ගලයකු වෙත, උරුමය සහ අනුප්‍රාප්තිය පිළිබඳ නීතිය ප්‍රකාරව උරුම වී ඇති හෝ ත්‍යාග වශයෙන් ලැබී ඇති යම් අවසරලත් ආයෝජනයක යම් ආදායමක් සහ යම් ප්‍රාග්ධන ලැබීම් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව, එ.ජ.ඩො. 30,000ක වාර්ෂික දීමනාවකට යටත්ව, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමකට බැර කර එය හරහා ආපසු සියරට යවනු ලැබිය යුතු ය.

(ඉ) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 3 වන ඡේදය යටතේ අවසර ලබා දී ඇති පරිදි යම් විගාමිකයකු වෙත උරුම වන හෝ ත්‍යාග වශයෙන් ලැබුණු යම් ආදායමක් සහ යම් වත්කමක යම් ප්‍රාග්ධන ලැබීම්, කලින් කලට සංශෝධනය විය හැකි පරිදි වන 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝගවලට යටත්ව ආපසු සියරට යවනු ලැබිය යුතු ය.

(6) 2017 නොවැම්බර් මස 20 වැනි දිනට පෙර සිදු කරන ලද ආයෝජනවල ලැබීම් ආපසු සියරට යැවීම-

(අ) 2017 නොවැම්බර් මස 20 වන දිනට පෙර සිදු කරන ලද ඉහත ආයෝජනවල යම් ආදායම් සහ යම් ප්‍රාග්ධන ලැබීම්, ආයෝජනය සඳහා වන ආමුඛ ප්‍රේෂණවල සාක්ෂි ඉදිරිපත් කිරීමට යටත්ව, ආයෝජකයා විසින් විවෘත කරනු ලැබ ඇති ආමුඛ ආයෝජන ගිණුමක් හරහා හෝ ඒකක භාරවල ඒකකවල ආයෝජන සිදු කරන ලද අවස්ථාවක දී, ඍජුවම, ආයෝජකයාගේ ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමක් වෙතට පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

(ආ) 2010 ජනවාරි මස 1 වන දිනට පෙර සිදු කරන ලද ආයෝජන සඳහා ආමුඛ ප්‍රේෂණ පිළිබඳ සාක්ෂි නොපවතින අවස්ථාවක දී, එකී ආයෝජනයේ යම් ආදායම් සහ යම් ප්‍රාග්ධන ලැබීම්, බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා විසින් සිදුකරන ලද ගනුදෙනුවේ සද්භාවය පිළිබඳ සෑහීමකට පත් වීමෙන් පසුව, නේවාසික නොවන ආයෝජකයා විසින් විවෘත කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා හෝ ඒකක භාරවල ඒකකවල ආයෝජන සිදු කරන ලද අවස්ථාවක දී ආයෝජකයාගේ ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමක් වෙත ඍජුවම ප්‍රේෂණය කිරීමෙන් පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

(7) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 4 වැනි ඡේදයේ (5) වැනි අනුඡේදයේ (ආ) අයිතමය යටතේ සඳහන් කරන ලද ආයෝජන සඳහා හෝ 2010 ජනවාරි මස 1 වන දින සිට 2017 නොවැම්බර් මස 20 වන දින දක්වා කාලසීමාව තුළදී සිදු කරන ලද ආයෝජන සඳහා ආමුඛ ප්‍රේෂණ පිළිබඳ සාක්ෂි නොපවතින අවස්ථාවක දී, එම ආයෝජනවල යම් ආදායම් හෝ ප්‍රාග්ධන ලැබීම්, අවස්ථාවෝචිත පරිදි, ආයෝජකයා විසින් හෝ ප්‍රතිලාභියා විසින් විවෘත කරන ලද, අවස්ථාවෝචිත පරිදි, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් වෙත හෝ නේවාසික නොවන රුපියල් ගිණුමක් වෙත බැර කරනු ලැබිය යුතු අතර පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව එ.ජ.ඩො. 30,000ක වාර්ෂික දීමනාවකට යටත්ව ආපසු සියරට යවනු ලැබිය යුතු ය.

(8) බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් හෝ විශේෂිත කල්බදු සමාගම් විසින්, මෙම නියෝග යටතේ නිකුත් කරන ලද හෝ ලබා ගන්නා ලද ණය සුරැකුම්පත් හෝ ණය, අදාළ නියාමන අධිකාරියේ අනුමැතියට යටත්ව, සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කරනු ලැබිය හැකි ය. 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සමාගම් විසින් නිකුත් කරන ලද හෝ ලබා ගන්නා ලද ලැයිස්තුගත නොකළ ණය සුරැකුම්පත් හෝ ණය, අවස්ථාවෝචිත පරිදි, නිකුත් කිරීමේ හෝ ලබා ගැනීමේ දින සිට මාස 18ක් ඉකුත් වීමෙන් පසුව සාමාන්‍ය කොටස් බවට පමණක් පරිවර්තනය කරනු ලැබිය හැකි ය. 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද සමාගම් විසින් නිකුත් කරන ලද ලැයිස්තුගත ණය සුරැකුම්පත්, කොළඹ කොටස් හුවමාරුවේ නියෝගවලට අනුකූලව සාමාන්‍ය කොටස් බවට පමණක් පරිවර්තනය කරනු ලැබිය හැකි ය.

5. නේවාසික නොවන ආයෝජකයින් විසින්, ශ්‍රී ලංකාවේ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක අක්වෙරළ බැංකු ඒකකවල පවත්වාගෙන යන ගිණුම් හරහා අරමුදල් සැපයීම මගින්, කිසිදු සීමා කිරීම්වලින් තොරව, ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත නොකළ සහ ශ්‍රී ලංකාවේ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කළ සමාගම්වල කොටස්වල හෝ ණය සුරැකුම්පත්වල ආයෝජනය කළ හැකි ය.

6. නේවාසික නොවන රුපියල් ගිණුම්වල පවත්වාගෙන යනු ලබන අරමුදල්වලින් විගාමිකයන් විසින් සිදු කරනු ලබන ආයෝජන.

(1) යම් විගාමිකයකුට, එම විගාමිකයාගේ නේවාසික නොවන රුපියල් ගිණුමක පවත්වාගෙන යනු ලබන අරමුදල්වලින්, උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (8) වන අනුඡේදයේ (ඇ) අයිතමය හැර, උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන, (2) වන, (3) වන සහ (8) වන අනුඡේද යටතේ අවසර ලබා දී ඇති ආයෝජන සිදු කිරීම සඳහා අවසර ඇත.

(2) එම ආයෝජනවල සියලු ආදායම් සහ ප්‍රාග්ධන ලැබීම් එම ආයෝජන සිදු කරන ලද්දේ කවර නේවාසික නොවන රුපියල් ගිණුම හරහා ද එම අදාළ නේවාසික නොවන රුපියල් ගිණුම් වෙත බැර කරනු ලැබිය යුතු ය.

(3) එම ආයෝජනවලින් උපයා ගනු ලබන සියලු ආදායම්, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව, සුදුසුකම්ලත් සංක්‍රමණ දීමනාවට යටත් නොවෙමින්, (අදාළ වන පරිදි) අදාළ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම හරහා පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

(4) එම ආයෝජනවල යම් ප්‍රාග්ධන ඉපැයුම්, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව, සුදුසුකම්ලත් සංක්‍රමණ දීමනාවට යටත්ව, අදාළ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හරහා පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

7. බැහැර කිරීම්- මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදය යටතේ වන අවසරය පහත දැක්වෙන ව්‍යාපාරවලින් යම් ව්‍යාපාරයක් සිදු කිරීමට යෝජනා කරන හෝ සිදු කරගෙන යන සමාගමක ඡන්දය දීමේ අයිතිය හිමි කොටස් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය -

(1) භාණ්ඩ උකසට ගැනීම;

(2) (ධීවර විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අර්ථ දක්වනු ලබන පරිදි) වෙරළබඩ මසුන් ඇල්ලීම;

(3) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන් විසින් දායකත්වය දරනලද ප්‍රාග්ධනය, එ.ජ.ඩො. මිලියන 5 ට අඩුවන අවස්ථාවක දී, සිල්ලර වෙළඳාම;

8. සීමා කිරීම් -

(1) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදය යටතේ වන අවසරය, පහත සඳහන් ව්‍යාපාරවලින් යම් ව්‍යාපාරයක් කරගෙන යන හෝ කරගෙන යාමට යෝජනා කරන සමාගමක ඡන්දය දීමේ අයිතිය හිමි කොටස් සම්බන්ධයෙන් එකී සමාගමේ සම්පූර්ණයෙන් ගෙවන ලද ඡන්දය දීමේ අයිතිය හිමි කොටස් සංඛ්‍යාවෙන් 40% ක ප්‍රතිශතයක් දක්වා පමණක් හෝ යම් සමාගමක විදේශ ආයෝජනයන්හි වඩා ඉහළ ප්‍රතිශතයක් සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් විශේෂ අනුමැතියක් ප්‍රදානය කර ඇත්නම්, එකී ඉහළ ප්‍රතිශතය දක්වා පමණක් අදාළ විය යුතු ය.

(අ) ශ්‍රී ලංකාවේ අපනයන ජාත්‍යන්තර වශයෙන් නිශ්චය කරන ලද සලාක සීමා කිරීම්වලට යටත් වන අවස්ථාවක දී, භාණ්ඩ නිෂ්පාදනය;

(ආ) තේ, රබර්, පොල්, කොකෝවා, සහල්, සීනි සහ කුළුබඩු වගා කිරීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(ඇ) පුනර්ජනනීය නොවන ජාතික සම්පත් කැණීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(ඈ) දේශීය දැව භාවිතයෙන් සිදු කරනු ලබන දැව පදනම් කරගත් කර්මාන්ත;

(ඉ) (ධීවර විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අර්ථ දක්වනු ලබන පරිදි) ගැඹුරු මුහුදෙහි මසුන් ඇල්ලීම;

(ඊ) ජන සන්නිවේදනය;

(උ) අධ්‍යාපනය;

(ඌ) භාණ්ඩ ප්‍රවාහනය;

(එ) සංචාරක නියෝජ්‍යායතන;

(ඒ) නැව් ප්‍රවාහන නියෝජ්‍යායතන;

(2) උපලේඛනයේ මේ කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදය යටතේ වන අවසරය, මෙහි පහත නිශ්චිතව දක්වා ඇති ව්‍යාපාරවලින් යම් ව්‍යාපාරයක් කරගෙන යන හෝ කරගෙන යාමට යෝජනා කරන සමාගමක ඡන්දය දීමේ අයිතිය හිමි කොටස් සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා රජය විසින් එකී ව්‍යාපාරයන්හි විදේශ ආයෝජන සඳහා අනුමැතිය ලබා දීම පිණිස පිහිටුවා ඇති අදාළ නීතිමය හෝ පරිපාලන අධිකාරියක් මගින් ප්‍රදානය කරනු ලබන

සාමාන්‍ය හෝ විශේෂ අනුමැතියක් ලබා දී ඇත්තේ කවර කොටස් ප්‍රතිශතයක් සඳහා ද, එම සමාගමේ සම්පූර්ණයෙන් ගෙවන ලද ඡන්දය දීමේ අයිතිය හිමි කොටස් සංඛ්‍යාවේ ප්‍රතිශතය දක්වා පමණක් අදාළ විය යුතු ය.

(අ) ගුවනින් ප්‍රවාහනය කිරීම;

(ආ) (නාවික විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අර්ථ දක්වනු ලබන පරිදි) වෙරළබඩ නැව් ප්‍රවාහනය;

(ඇ) 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කර්මාන්තමය ව්‍යවසායයන්; එනම්,

(i) ආයුධ, පතරොම්, පුපුරන ද්‍රව්‍ය, යුධ වාහන සහ උපකරණ, ගුවන් යානා සහ අනෙකුත් යුධමය දෘඩාංග නිෂ්පාදනය කරනු ලබන යම් කර්මාන්තයක්;

(ii) විෂ, මාදක, මද්‍යසාර, අන්තරායකර ඖෂධ සහ විෂ සහිත, උපද්‍රවකාරී හෝ පිළිකාකාරක ද්‍රව්‍ය නිෂ්පාදනය කරනු ලබන යම් කර්මාන්තයක්;

(iii) ව්‍යවහාර මුදල්, කාසි හෝ සුරැකුම්පත් ලේඛන, නිපදවනු ලබන යම් කර්මාන්තයක්;

(ඈ) මහා පරිමාණ යාන්ත්‍රික මැණික් කැණීම;

(ඉ) ලොතරැයි.

**ආ. ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම.**

1. (1) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති විදේශීය සමාගමකට ශ්‍රී ලංකාව තුළ,

(අ) උපලේඛනයේ මේ කොටසේ "ආ" ශීර්ෂය යටතේ 3 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාකාරකම් හැර, යම් වාණිජමය, වෙළඳ හෝ කර්මාන්ත ක්‍රියාකාරකමක් කරගෙන යා හැකි ය. එසේ වුව ද උපලේඛනයේ මේ කොටසේ "ආ" ශීර්ෂය යටතේ 4 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් විදේශ ආයෝජන සඳහා අනුමැතිය ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකා රජය විසින් පිහිටුවා ඇති අදාළ නෛතික හෝ පරිපාලන අධිකාරියක පූර්ව අවසරය ලබා ගෙන තිබිය යුතු ය; හෝ

(ආ) සම්බන්ධීකරණ කාර්යාලයක්, නියෝජිත කාර්යාලයක්, ප්‍රාදේශීය කාර්යාලයක් හෝ වෙනත් ඒ හා සමාන කාර්යාලයක් විසින් සිදු කිරීමට භාරගෙන ඇති හෝ සිදු කරනු ලබන්නා වූ, එසේ වුව ද එම ක්‍රියාකාරකම් සිදු කිරීමෙන් ශ්‍රී ලංකාව තුළ වූ විදේශ සමාගමට සෘජුව හෝ වක්‍රව යම් ආදායමක් ජනනය කරනු නොලබන්නා වූ, යම් වාණිජ, වෙළඳ හෝ කර්මාන්ත නොවන යම් ක්‍රියාකාරකමක් සිදු කරනු ලැබිය හැකි ය.

(2) ඉහත සඳහන් යම් ක්‍රියාකාරකමක් සිදු කරගෙන යාමට භාරගෙන ඇති හෝ සිදු කරනු ලබන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති යම් විදේශීය සමාගමක,

(අ) ව්‍යාපාර ස්ථානය, ශාඛා කාර්යාලයක්, ව්‍යාපෘති කාර්යාලයක් හෝ වෙනත් ඒ හා සමාන කාර්යාලයක් වන අවස්ථාවක දී, ශ්‍රී ලංකාවේ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමඟ විදේශයේ පිහිටි මව් සමාගම විසින් විවෘත කර ඇති ආමුඛ ආයෝජන ගිණුමක් හරහා යොමු කරන ලද අවම වශයෙන් එ.ජ.ඩො. 200,000ක හෝ ඊට සමාන නම් කරන ලද වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් වන ආයෝජනයක් එකී විදේශ සමාගමේ ගිණුමක බැරට ලැබිය යුතු අතර, එකී ආයෝජනය සනාථ කිරීම සඳහා වන සාක්ෂි ලියාපදිංචි කිරීමේ දින සිට දින අනූවක් (90) ඇතුළත සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත සැපයිය යුතු ය. එකී අරමුදල් ආයෝජනයක් වශයෙන් සමාගමේ පොත්වල සටහන් කළ යුතු අතර ශ්‍රී ලංකාව තුළ සමාගම එහි ව්‍යාපාර කටයුතු අවසන් කරන තුරු සමාගමේ පොත්වල ඇති එම සටහන් පවත්වාගෙන යා යුතු ය.

(ආ) ව්‍යාපාර ස්ථානය, සම්බන්ධීකරණ කාර්යාලයක්, නියෝජිත කාර්යාලයක් හෝ වෙනත් ඒ හා සමාන කාර්යාලයක් වන අවස්ථාවක දී, එකී ව්‍යාපාරික ස්ථානය පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අරමුදල්, විදේශයේ පිහිටි මව් සමාගම විසින් ශ්‍රී ලංකාවේ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමඟ විවෘත කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා විදේශ සමාගමේ ගිණුමක බැරට ලැබිය යුතු ය.

2. උපලේඛනයේ මේ කොටසේ 'ආ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදයේ සඳහන් විදේශ සමාගමක් විසින්, ආයෝජනය සිදු කරනු ලැබූ එහි මව් සමාගමේ ආමුඛ ආයෝජන ගිණුම හරහා ඔවුන්ගේ ලාභය, රාජ්‍ය භාගය, වරලත් ව්‍යාපාරික ගාස්තු හෝ ඊට සමාන වෙනත් ගෙවීම් හෝ ගිණුම අවසන් කරනු ලබන අවස්ථාවේ දී පවතින අතිරික්ත අරමුදල්, බදු අඩු කළ පසු, ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කරනු ලැබිය හැකි ය. 2017 නොවැම්බර් මස 20 වන දිනට පෙරාතුව ලියාපදිංචි කරන ලද විදේශීය සමාගමක් විසින්, බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා විසින් ගනුදෙනුවේ සද්භාවය පිළිබඳව සෑහීමට පත් වීමෙන් පසු, එකී ගෙවීම්, මව් සමාගමේ ආමුඛ ආයෝජන ගිණුමක් හරහා ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

3. උපලේඛනයේ මේ කොටසේ 'ආ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදයේ (අ) අයිතමයේ කාර්යය සඳහා, පහත දැක්වෙන වාණිජමය, වෙළඳ සහ කර්මාන්ත ක්‍රියාකාරකම්, විදේශ සමාගමක් විසින් සිදු කිරීම සඳහා අවසර දෙනු නොලැබේ -

(1) (1988 අංක 30 දරන බැංකු පනත යටතේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද විදේශ බැංකු ශාඛා හැර) මුදල් ණයට දීම;

(2) භාණ්ඩ උකසට ගැනීම;

(3) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන් විසින් දායකත්වය දරන ලද ප්‍රාග්ධනය, ආයෝජනයෙන් පසු, එ.ජ.ඩො. මිලියන 5 කට අඩු වන අවස්ථාවක දී, සිල්ලර වෙළඳාම;

(4) (ධීවර විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අර්ථ දක්වනු ලබන පරිදි) වෙරළබඩ මසුන් ඇල්ලීම;

(5) තේ, රබර්, පොල් සහ සහල් වගාකිරීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(6) පුනර්ජනනීය නොවන ජාතික සම්පත් කැණීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(7) භාණ්ඩ ප්‍රවාහනය;

(8) නැව් ප්‍රවාහන නියෝජිත ව්‍යාපාරය;

(9) යාන්ත්‍රික මැණික් කැණීම; සහ

(10) ලොතරැයි.

4. උපලේඛනයේ මේ කොටසේ 'ආ' ශීර්ෂයේ 1 වන ඡේදයේ (1) වන අනුඡේදයේ (අ) අයිතමයේ කාර්යය සඳහා, විදේශ ආයෝජන සඳහා අනුමැතිය ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකා රජය විසින් පිහිටුවන ලද අදාළ නීතිමය හෝ පරිපාලන අධිකාරියේ පූර්ව අවසරය සහිතව පහත දැක්වෙන කටයුතු සිදු කිරීම සඳහා අවසර ලබා දෙනු ලැබේ -

(1) ශ්‍රී ලංකාවේ අපනයන ජාත්‍යන්තර වශයෙන් නිශ්චය කරන ලද සලාක සීමාකිරීම්වලට යටත් වන අවස්ථාවක දී, භාණ්ඩ නිෂ්පාදනය;

(2) සීනි, කොකෝවා සහ කුළුබඩු වගාකිරීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(3) දේශීය දැව භාවිතයෙන් සිදු කරනු ලබන දැව පදනම් කරගත් කර්මාන්ත;

(4) (ධීවර විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විසින් අර්ථ දක්වනු ලබන පරිදි) ගැඹුරු මුහුදෙහි මසුන් ඇල්ලීම;

(5) ජන සන්නිවේදනය;

(6) අධ්‍යාපනය;

(7) ශ්‍රී ලංකාවෙන් පිටත සංචාරක නියෝජිත ව්‍යාපාරය;

(8) දේශීය ගුවන් ප්‍රවාහනය;

(9) (අ) ආයුධ, පතරොම්, පුපුරන ද්‍රව්‍ය, යුධ වාහන සහ ගුවන් යානා උපකරණ සහ වෙනත් යුධමය දෘඩාංග;

(ආ) විෂ, මාදක, මද්‍යසාර, අන්තරායකර ඖෂධ සහ විෂ සහිත උපද්‍රවකාරී හෝ පිළිකාකාරක ද්‍රව්‍ය; සහ

(ඇ) ව්‍යවහාර මුදල්, කාසි සහ සුරැකුම්පත් ලේඛන,

නිෂ්පාදනය කරනු ලබන හෝ නිපදවනු ලබන යම් කර්මාන්තයක්.

II වන කොටස

**ශ්‍රී ලංකා රජය විසින් ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කරනු ලැබීම සඳහා වන අවසරය**

ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික යම් තැනැත්තකු වෙත යම් විදේශ ව්‍යවහාර මුදලකින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හෝ වෙනත් වර්ගවල ණය සුරැකුම්පත් නිකුත් කිරීම සහ නිකුත් කිරීමට අදාළව එකී තැනැත්තන් වෙත යම් ගෙවීමක් සිදුකිරීම සඳහා, ඒ සම්බන්ධයෙන් වන අදාළ අධිකාරීන් හි අවසරයන්ට යටත්ව ශ්‍රී ලංකා රජයට අවසර ලබා දෙනු ලැබේ.

III වන කොටස

**නේවාසික තැනැත්තන් සඳහා වන අවසර**

1. මේ නියෝග යටතේ දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීම සඳහා මේ උපලේඛනයේ I වන කොටස යටතේ නිශ්චිතව සඳහන් යම් නේවාසික තැනැත්තකු හට, මේ නියෝගවල විධිවිධානවලට හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් ලිඛිත නීතියකට යටත්ව, කොටස් හෝ අවසර ලද යම් සුරැකුම්පත් සහ බැඳුම්කර නිකුත් කිරීම සඳහා හෝ නිශ්චල දේපළ ණයට ගැනීම සඳහා හෝ නිශ්චල දේපළ විකිණීම සඳහා සහ තැන්පතු භාර ගැනීම සඳහා අවසර දෙනු ලැබේ.

2. මේ නියෝගවල විධිවිධානවලට හෝ ශ්‍රී ලංකාවේ වෙනත් යම් ලිඛිත නීතියකට යටත්ව, අවසර ලද යම් සුරැකුම්පත් සහ බැඳුම්කර නිකුත් කිරීම හෝ ණයට ගැනීම සඳහා උපලේඛනයේ I වන කොටස යටතේ නිශ්චිතව දක්වා ඇති ශ්‍රී ලංකා රජයට අවසර දෙනු ලැබේ.

3. කොටස් අත්පත් කරගැනීමේ හෝ පැවරීමේ ක්‍රම නොසලකා, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සමාගම් විසින්, මේ නියෝගවලට යටත්ව, නේවාසික නොවන ආයෝජකයකුගේ නමින් කොටස් නිකුත් කිරීම, පැවරීම සහ ලියාපදිංචි කිරීම කරනු ලැබිය යුතු ය.

4. විගාමිකයකුගේ දෙමාපියන්ගෙන් අයෙකු, සීයා හෝ ආච්චි, සහෝදරයකු හෝ සහෝදරියක හෝ කලත්‍රයකු වන නේවාසික පුද්ගලයකුට, විගාමිකයාට දෙනු ලබන ත්‍යාගයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ඇති යම් වත්කමක් පැවරීම සඳහා අවසර ලබාදෙනු ලැබේ.

5. මහ බැංකුව විසින් කාලය දීර්ඝ කිරීමක් ප්‍රදානය කරනු ලැබුවේ නම් මිස, ආයෝජනය සඳහා ආමුඛ ප්‍රේෂණ ලද දින සිට මාස තුනක් (3) ඇතුළත, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි වන සමාගම් හෝ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින්, උපලේඛනයේ I වන කොටසේ 'අ' ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1) වන සහ (2) වන අනුඡේද යටතේ අවසර ලබා දී ඇති (අදාළවන අවස්ථාවක දී) කොටස් සහ ණය සුරැකුම්පත් නිකුත් කිරීම, පැවරීම හෝ ලියාපදිංචි කිරීම කරනු ලැබිය යුතු ය.

6. 2017 නොවැම්බර් මස 20 වන දිනට පෙර ලැබුණු ආමුඛ ප්‍රේෂණ හෝ මේ නියෝග ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනට පෙර ආයෝජකයන්ගේ ආමුඛ ආයෝජන ගිණුමක් හරහා ලැබුණු ආමුඛ ප්‍රේෂණ, මේ නියෝග ගැසට් පත්‍රයේ පළ කරන ලද දින සිට දින අනූවක් (90) ඇතුළත උපලේඛනයේ I වන කොටසේ 'අ' ශීර්ෂය යටතේ 7 වන සහ 8 වන ඡේදවල සඳහන් බැහැරකිරීම් සහ සීමාවන්ට යටත්ව කොටස් නිකුත් කිරීම සඳහා 2007 අංක 7 දරන සමාගම් පනතේ අර්ථ දක්වා ඇති පරිදි වන සමාගම්වලට අවසර ලබා දෙනු ලැබේ. ආයෝජනය සඳහා වන ආමුඛ ප්‍රේෂණය සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු ආයෝජකයා විසින් විවෘත කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා පමණක් එම ආයෝජනවල සියලුම ආදායම සහ යම් ප්‍රාග්ධන ලැබීම් ආපසු සියරට යවනු ලැබිය යුතු ය.

IV වන කොටස

පනත ක්‍රියාත්මක වීමට පෙරාතුව ප්‍රදානය කරන ලද යම් (සාමාන්‍ය හෝ විශේෂ) අනුමැතියක් යටතේ සිදු කරනු ලබන සහ මේ නියෝගවල නිශ්චිතව සඳහන් ප්‍රාග්ධන ගනුදෙනුවලට සාරානුකූලව සමාන වන්නා වූ දැනට පවතින සියලු ප්‍රාග්ධන ගනුදෙනු, මේ නියෝග මගින් හෝ යම් පසුව සාදනු ලබන නියෝග මගින් නිශ්චිත වශයෙන් වෙනස් කරනු ලැබුවහොත් මිස එම අනුමැතිය යටතේ වන එකී ගනුදෙනු සඳහා නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්ව අඛණ්ඩව සිදු කරගෙන යනු ලැබිය හැකි ය.

V වන කොටස

**දැනට පවතින ගිණුම් නැවත නම් කිරීම ආදිය**

1. ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ විවෘත කරන ලද දැනට පවතින සියලු විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම්, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන්ගෙන් එකී විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් හරහා නේවාසික ණය ගැනුම්කරුවන් විසින් ලබා ගන්නා ලද විදේශ ව්‍යවහාර ණය මුදල් සම්පූර්ණයෙන් පියවන තෙක් අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු ය.

2. 2017 නොවැම්බර් මස 17 වන දිනැති අංක 2045/56 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2017 අංක 2 දරන විදේශ විනිමය (ප්‍රාග්ධන ගනුදෙනුවල යෙදීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග යටතේ නැවත නම් කරන ලද සියලු ආමුඛ ආයෝජන ගිණුම්, එම නියෝග පරිච්ඡින්න කිරීම නොතකා නැවත නම් කරන ලද පරිදි අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු ය.

VI වන කොටස

**ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමේ බලය**

1. ආමුඛ ආයෝජන ගිණුම්

මේ නියෝග යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලත් තැනැත්තන්ගේ නමින් ආමුඛ ආයෝජන ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා, බලයලත් වෙළෙන්දෙකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට බලය තිබිය යුතු ය -

(1) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයෙකු;

(2) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකික ද්විත්ව පුරවැසියෙකු;

(3) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික, වෙනත් රටක නිත්‍ය වාසිකත්වය හෝ පුරවැසිභාවය ලබා ගෙන ඇති ශ්‍රී ලාංකික ජාතිකයෙකු;

(4) (විගාමිකයන් හැර) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික, විදේශයක සේවයෙහි නියුක්ත ශ්‍රී ලාංකික පුරවැසියෙකු;

(5) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගමක්;

(6) ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කරන ලද හවුල් ව්‍යාපාරයක්;

(7) ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද දේශීය අරමුදල්, ප්‍රාදේශීය අරමුදල්, අන්‍යොන්‍ය අරමුදල්, ඒකක භාර සහ විදේශීය ආයතනික ආයෝජකයන්;

(8) බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු සමඟ ආමුඛ ආයෝජන ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ මියගිය තැනැත්තෙකුගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරුවෙකු හෝ පොල්ම:කරුවෙකු;

(9) බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු සමඟ ආමුඛ ආයෝජන ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ සමාගමක ප්‍රතිග්‍රාහකයෙකු හෝ ඈවරකරුවෙකු;

(10) කලින් කලට මහ බැංකුව විසින් බලය ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකු හෝ පුද්ගල ගණයක්.

2. විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම්

පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන්ගෙන් ණයට ගැනීම සඳහා අවසර ලත් තැනැත්තන්ගේ නමින් විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙන්දෙකුට හෝ පරිසීමිත වෙළෙන්දෙකුට බලය තිබිය යුතු ය.

3. වෙනත් නියම සහ කොන්දේසි

(1) ආමුඛ ආයෝජන ගිණුම් සහ විදේශීය වාණිජ ණය ගැනීමේ ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා සහ එම ගිණුම් සම්බන්ධයෙන් වන අවසර ලත් හරකිරීම් සහ බැරකිරීම් සඳහා වන නිර්ණායක, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානයන් මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(2) උපලේඛනයේ මේ කොටසේ 1 වන සහ 2 වන ඡේදයන්හි නිශ්චිතව දක්වා ඇති ගිණුම් විවෘතකර පවත්වාගෙන යාමට අපේක්ෂා කරන තැනැත්තන්, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරන ලද අදාළ විධානවල නිශ්චිතව දක්වා ඇති නිර්ණායක යටතේ එම ගිණුම විවෘත කර පවත්වාගෙන යාම සඳහා සුදුසුකම් ලබන්නේ ද යන වග නිශ්චය කර ගැනීම සඳහා බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු විසින් නිසි උද්යෝගයෙන් සහ සාධාරණ සැලකිල්ලක් ඇතිව කටයුතු කළ යුතු ය. සෑම බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු විසින්, ගිණුම පවත්වාගෙන යනු ලබන කාල සීමාවේ දී සහ එකී ගිණුම් වසා දැමීමෙන් පසු අවුරුදු හයකට නොඅඩු කාල සීමාවක්, ගිණුම් හිමියන්ගේ සුදුසුකම් සනාථ කිරීමේ සාක්ෂියක් වශයෙන් ඔවුන්ට අදාළ තොරතුරු සහ ලේඛනගත සාක්ෂි පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

02 - 378

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.